# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# 2015

නිපුණතා සංවර්ධන අරමුදල

திறன்கள் அபிவிருத்தி நிதியம்

SKILLS DEVELOPMENT FUND LIMITED

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01 | ආයතනික පසුබිම | 02 |
| 02 | නිපුණතා සංවර්ධන අරමුදලේ තේමාව, දැක්ම සහ මෙහෙවර | 03 |
| 03 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල පිහිටුවීම | 04 |
| 04 | සංවිධාන ව්‍යුහය | 05 - 06 |
| 05 | අධ්‍යක්ෂ මණ්ඩලය - 2015 | 07 |
| 06 | කාර්ය සාධන සාමාලෝචනය | 08 - 09 |
| 07 | ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 10 |
| 08 | වාර්ෂික අවසාන ගිණුම් වාර්තාව 2015 / 2016 | 11 - 35 |

# ආයතනික පසුබිම

| | | |
|---|---|---|
| **ආයතනයේ නම** | - | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| **තත්ත්වය** | - | සම්පූර්ණයෙන් රජය සතු සමාගමකි |
| **අමාත්‍යාංශය** | - | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| **ලිපිනය** | - | අංක : 354/2,7 වන මහළ,<br>"නිපුණතා පියස",<br>ඇල්විටිගල මාවත,<br>නාරාහේන්පිට,<br>කොළඹ 05. |
| **වෙබ් ලිපිනය** | - | www.skillsdevelop.lk |
| **විද්‍යුත් තැපෑල** | - | info@skillsdevelop.lk |
| **දුරකථනය** | - | 011-2507274 |
| **ෆැක්ස්** | - | 011-2055601 |
| **බැංකුකරුවන්** | - | ලංකා බැංකුව / මහජන බැංකුව |
| **විගණකවරුන්** | - | ඒ. ඩී. එන්. ඩී. සමරක්කොඩි සහ සමාගම<br>(වරලත් ගණකාධිකාරීන්) |

# සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල

**තේමාව**

පුද්ගල සංවර්ධනය තුළින් විශිෂ්ඨත්වය සහ සාර්ථකත්වය

**දැක්ම**

නිපුණතා සංවර්ධනයෙහි ජාතික නායකත්වය

**මෙහෙවර**

නිපුණතා සංවර්ධනය තුළින් ජාතික ව්‍යවසාය තරගකාරීත්වය උද්දීපනය කිරීම

## නිපුණතා සංවර්ධන අරමුදල ස්ථාපිත කිරීම

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල යනු කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකායේ නිර්දේශය මත 1998 දී නියමු ව්‍යාපෘතියක් ලෙස පිහිටුවන ලද්දකි. මෙම කාලය තුළ ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල එයට අනුග්‍රහය දැක්වීය.

1999 අගෝස්තු 20 වන දින, සීමාසහිත වගකීම් සමාගමක් ලෙස, 1982 අංක 17 දරණ සමාගම් ආඥා පනත යටතේ සී/ස නිපුණතා සංවර්ධන අරමුදල සංස්ථාගත කරන ලදි. ලි.ප. අංකය: N(PBS)832

1999 සැප්තැම්බර් මාසයේ දී සමාගමේ කොටස් මිළදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය රු.දශලක්ෂ සියයක මුදලක් අනුමත කළ අතර අරමුදල විසින් එය සුරක්ෂිත ලෙස ආයෝජනය කරන ලදී. මෙම සුරක්ෂිත ආයෝජනයෙන් ලැබෙන ආදායමත් සමාගමේ මෙහෙයුම් මඟින් ලැබෙන ආදායමත් අරමුදලේ ප්‍රවර්තන වියදම් සඳහා ප්‍රමාණවත් බවට යෝජනා කරන ලදි. නිපුණතා සංවර්ධන අරමුදල ස්වයං ආදායම් උත්පාදක ආයතනයක් ලෙස ස්ථාපනය කරන ලද අතර රජය විසින් සපයන ලද රුපියල් දශලක්ෂ 100 ට අමතරව ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය සහ තවත් පෞද්ගලික ආයෝජකයෙකුද ආරම්භයේදී අරමුදලට දායකත්වය සපයා ඇත.

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල 2007 අංක 07 දරණ නව සමාගම් ආඥාපනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස නැවත ලියාපදිංචි කරන ලද අතර (ලියාපදිංචි අංකPB833) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

### ප්‍රධාන අරමුණු

අරමුදලේ සංස්ථා පත්‍රයේ සඳහන් පරිදි එහි පුළුල් අරමුණු මෙසේය.

- රැකියා ප්‍රවිෂ්ඨ පුහුණුව, නිපුණතා සංවර්ධනය සහ සේවක ප්‍රතිපුහුණුව
- පුහුණුව, නිපුණතාවය සහ අභිප්‍රේරණය සහිත ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා ව්‍යවසාය පදනම් කරගත් පුහුණු කිරීම් පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම
- පුහුණු ආයතන සහ සේව්‍ය පක්ෂය අතර සම්බන්ධතා සම්පාදනය කිරීම

# සංවිධාන ව්‍යුහය


සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
වැඩසටහන් අංශය
පාලන හා ගිණුම් අංශය
උපදේශක - අලෙවි සහ වැඩසටහන් කළමනාකරණ
උපදේශක - වැඩසටහන් සංවර්ධන හා ඇගයුම්
ගණකාධිකාරී/ප්‍රධාන මූල්‍ය නිලධාරී - මූල්‍ය සහ පාලන
වැඩසටහන් නිලධාරී
වැඩසටහන් නිලධාරී
මූල්‍ය සහ පරිපාලන නිලධාරී
කළමනාකරණ සහකාර
පුහුණු උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
රියදුරු
කාර්යාල කාර්ය සහායක

## නිපුණතා සංවර්ධන අරමුදලේ සේවක සංඛ්‍යා

2015.12.31 දිනට පැවති පරිදි



## අධ්‍යක්ෂ මණ්ඩලය - 2015



නිපුණතා සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මෙසේ ය.

01. මලිත් ජයතිලක මහතා ( සභාපති )
02. එස්.ආර්.ඩබ්.එම්.පී. සත්කුමාර මහතා (මහා භාණ්ඩාගාර නියෝජිත)2012-06-07 සිට
03. ජේ. ඒ. හේමසිරි ජයලත් මහතා
04. ආර්. එල්. පී. පීරිස් මහතා
05. හේම මාදිවෙල මහතා
06. සද්ධාතිස්ස දසනායක මහතා
07. කීර්ති මුතුකුමාරණ මහතා
08. මේජර් එල්. ජී. කේ. කිත්සිරි
09. එච්. එම්. රංජිත් කිරිඇල්ල මහතා
10. එස්. පී. රංජිත් ප්‍රනාන්දු මහතා
11. එන්.ඩී. සුගතදාස මහත්මිය

2015.12.15

01. එච්. ඒ. විමලසූරිය මහතා ( සභාපති )
02. එම්. ඒ. එස්. එච්. පෙරේරා මහතා (මහා භාණ්ඩාගාර නියෝජිත)
03. එන්. පූර්ණ පෙරේරා මහතා
04. ඩී. එල්. ඩී. චින්තක නිශාන්ත මහතා
05. කේ. රූපසිංහ ආරච්චි මහතා
06. ඩී. එම්. එස්. නදී කුමාර මහතා
07. ඩී. ඩී. කේ. චන්ද්‍රකීර්ති මහතා
08. එල්. ඒ. ඩී. ටී. පුෂ්පකුමාර මහතා
09. ඩී. ඩබ්. සී. කන්නන්ගර මහතා
10. ඩබ්. ඒ. එස්. එස්. ගුණසිංහ මහතා
11. එල්. ආර්. ඒ. කිංස්ලි පෙරේරා මහතා
12. පී. ජී. ඩී. නිශාන්ත ප්‍රේමලාල් මහතා

# කාර්යසාධන සමාලෝචනය

නිපුණතා සංවර්ධන අරමුදලෙන් සිදුවන මෙහෙය වන්නේ, නිපුණතාවය සංවර්ධනය තුළින් ජාතික ව්‍යවසාය තරඟකාරීත්වය උද්දීපනය කර ඉතා ශක්තිමත් ගුණාත්මක පුහුණු ආයතනයක් ශ්‍රී ලංකාව තුළ ගොඩ නගමින් රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශයේම සේවායෝජකයන් වෙත ඵලදායී හා ප්‍රතිලාභ සහිත ස්වසේවාස්ථානයේ කාර්යක්ෂමතාවයෙන් යුත් නම්‍යශීලී ජාතික ශ්‍රම වෙළඳ පොළකට අවශ්‍ය පුහුණුව, ක්‍රියාකාරීත්වය හා සහභාගීත්වය තුළින් සැපයීම යි.

නිපුණතා සංවර්ධන අරමුදල මානව සම්පත් හා නිපුණතා සංවර්ධනය අරමුණු කර ගත් විවිධ පුහුණු වැඩසටහන් සේවායෝජකයන්ගේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනීමට පහසු වන අයුරින් පවත්වා ගෙන යනු ලබයි. තවද, පසුගිය වසර තුළ අප වැඩසටහන් වල ආකෘතීන් නව්‍යකරණයෙන් යුක්තව කාර්යක්ෂමතාව හා ඵලදායීත්වය වර්ධනය වන අයුරින් ආයතනයන්හි සහයෝගීතාව තුළින් පුළුල් කරන ලදී. සේවාරම්භක තෙදින පුහුණු වැඩමුළු, මිල ගණන් හා ලංසු තැබීම, රාජ්‍ය කළමනාකරණ නිලධාරීන්ගේ වගකීම් හා කාර්යභාරය, මූල්‍ය කළමනාකරණය හා විගණන ගැටළු අවම කිරීම වැනි නව වැඩසටහන් හඳුන්වා දෙන ලදී. අරමුදලේ වැඩසටහන් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සේවායෝජක හා සේවාදායක යන දෙපාර්ශ්වයටම ගැලපෙන පරිදි මූල්‍ය, සේවා හා ඉලක්කගත අරමුණු කරා ලඟා විය හැකි පරිදි සැලසුම් කර ඇත.

**2015 වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යා මෙසේය.**



## නිපුණතා සංවර්ධන අරමුදලේ හවුල්කරුවන් වෙත ඉදිරිපත් කෙරෙන ස්වාධීන විගණක වාර්තාව

**<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව</u>**

නිපුණතා සංවර්ධන අරමුදල සමාගමේ 2015 මාර්තු 31වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, එසේ අවසන් වූ වසර සඳහා වන සම කොටස් විචලනයන් පිළිබඳ ප්‍රකාශනය හා මූල්‍ය ධාරා ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සෙසු කරුණු විස්තර කිරීමේ සටහන් පිළිබඳ සාරාංශයක් ඇතුළත් මේ සමග වන මූල්‍ය ප්‍රකාශනයන් අප විසින් විගණනය කර ඇත.

***<u>මූල්‍ය ප්‍රකාශන විෂයයෙහි කළමනාකාරිත්වයේ වගකීම</u>***

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශනයන් යහපත් පරිදි සැකසීම හා ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ. මෙම වගකීම් අතරට වංචනිකව හෝ ප්‍රමාද දෝෂයක් හේතුකොට සිදුවන ද්‍රව්‍යාත්මක සාවද්‍ය ප්‍රකාශන වලින් තොර මූල්‍ය ප්‍රකාශනයන් සැකසීම හා යහපත් පරිදි ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාම, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යෙදවීම, හා පවත්නා තත්ත්වයන් යටතේ සාධාරණ වූ ගිණුම්කරණ ඇස්තමේන්තු සැකසීම ඇතුළත් වේ.

***<u>ගිණුම්කරණ පරාසය හා මතය ඉදිරිපත් කිරීමේ පදනම</u>***

අපගේ වගකීම වනුයේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාර අපගේ විගණනය සිදු කළෙමු. මූල්‍ය ප්‍රකාශනයන් ද්‍රව්‍යාත්මක අවප්‍රකාශනයන්ගෙන් නිදහස්ද යන්න පිළිබඳව වූ සෑහීමකට පත්විය හැකි සහතිකයක් ලබා ගැනීම සඳහා අප විසින් විගණනය සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම එම ප්‍රමිතීන් මගින් අපේක්ෂිතය.

පරීක්ෂණ පදනමකින් මුදල් ප්‍රමාණයන් සාධාරණීකරණය කරන්නාවූ සාක්ෂි පරීක්ෂා කොට මූල්‍ය ප්‍රකාශනයන් තුළ හෙළි කිරීම විගණනයක් තුළට ඇතුළත් වේ. කළමනාකරණය විසින් භාවිත ගිණුම්කරණ ප්‍රතිපත්ති හා කළ වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම මෙන්ම සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීමද විගණනයක් තුළට ඇතුළත් වේ.

අපගේ විගණන කාර්යය සඳහා අපගේ උපරිම දැනීමට හා විශ්වාසයට අනුව අවශ්‍ය වූ සියලු තොරතුරු හා විස්තර අප විසින් ලබා ගෙන ඇත. එබැවින්, අපගේ මතය සඳහා වූ සාධාරණ පදනමක් විගණනය විසින් සම්පාදනය කරන්නේය යන්න අපගේ විශ්වාසයයි.

***<u>මතය</u>***

අපගේ මතය අනුව, නිරීක්ෂණයට ලක්වූ සීමාව තුළ, සමාගම විසින් 2015 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිසි ගිණුම්කරණ වාර්තා පවත්වා ගෙන ගොස් ඇති අතර, සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් හා මුදල් ප්‍රවාහ විසින් 2015 මාර්තු මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ කාර්ය තත්ත්වය පිළිබඳ සත්‍ය වූ හා සාධාරණ වූ අදහසක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාර ලබාදෙනු ලබයි.

***<u>සෙසු නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>***

අපගේ මතයට අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 (2) වගන්තියේ අවශ්‍යතා හා අනුගත වේ.

**ඒ. ඩී. එන්. ඩී. සමරක්කොඩි සහ සමාගම**
(වරලත් ගණකාධිකාරී)
කළමණාකරන කොටස් කරු ඒ. ඩී. එන්. ඩී. සමරක්කොඩි (FCA), B.Sc.(Bus.Adm)

2016.09.15.

**සී/ස නිපුණතා සංවර්ධන අරමුදල**

**"නිපුණතා පියස" 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.**

**2016 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන**

**විස්තීර්ණ ආදයම් ප්‍රකාශය**

| | | | |
|---|---|---|---|
| | | **2015/2016** | 2014/2015 |
| | **සටහන** | **රු. ශත** | රු. ශත |
| ආදයම | **03** | 51,624,800.00 | 56,310,690.00 |
| සෘජු පිරිවැය | **04** | (29,223,183.64) | (28,442,936.49) |
| **දළ ලාභය / (අලාභ)** | | **22,401,616.36** | **27,867,753.51** |
| වෙනත් ආදයම්/(වියදම්) | | - | (127,930.33) |
| | | 22,401,616.36 | 27,739,823.18 |
| පරිපාලන හා ආයතනික වියදම් | **05** | (33,505,138.16) | (28,202,051.31) |
| **පොළී සහ බදු වලට පෙර ඉපැයුම්** | | **(11,103,521.80)** | **(462,228.13)** |
| ශුද්ධ මූල්‍ය ආදයම | **07** | 7,823,666.31 | 10,063,964.33 |
| **බදුකරණයට පෙර ආදයම** | | (3,279,855.49) | 9,601,736.20 |
| **ආදායම් බදු** | **14** | 58,997.00 | (2,297,893.03) |
| **වර්ෂයේ ශුද්ධ ලාභය/(අලාභය)** | | **(3,220,858.49)** | **7,306,843.17** |
| **වෙනත් විස්තීර්ණ ආදයම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ ආයුගණක ලාභ/(අලාභ) | | - | (197,882.33) |
| වර්ෂයේ සමස්ථ විස්තීර්ණ ආදයම | | **(3,220,858.49)** | 7,108,960.84 |
| **කොටසකින් ලද ඉපැයුම්** | **15** | **(0.32)** | **0.72** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයේ අත්‍යාවශ්‍ය හා වැදගත් අංග වේ. වරහන් යොද පෙන්නුම් කර ඇත්තේ අඩු කළ අගයන් වේ.

## සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

## "නිපුණතා පියස" 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

## 2016 මාර්තු 31වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන් | 2015/2016 රු. ශත | 2014/2015 රු. ශත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | **06** | 11,518,131.73 | 14,750,808.14 |
| ස්ථිර තැන්පතු-ශිෂ්‍යත්ව අරමුදල | | 3,398,214.54 | 3,200,000.00 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ ලේඛනය | | 295,844.20 | - |
| ආයෝජන | **08** | 112,934,583.96 | 157,922,570.81 |
| වෙළඳ සහ අයවිය යුතු වෙනත් දෑ | **09** | 12,373,180.99 | 9,488,999.87 |
| මුදල් හා මුදල් සමාන දෑ | **10** | 45,845,677.50 | 3,770,640.69 |
| **මුළු වත්කම්** | | **186,365,632.92** | **189,133,019.51** |
| **සම කොටස් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **11** | 102,001,520.00 | 102,001,520.00 |
| ආදයම් සංචිත | | 479,890.00 | 479,890.00 |
| වෙනත් සංචිත | | (297,303.29) | (297,303.29) |
| රඳවා ගත් ඉපැයීම් | | 77,692,595.78 | 80,913,454.27 |
| සම කොටස් එකතුව | | **179,876,702.49** | **183,097,560.98** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | **12** | 1,591,256.14 | 1,351,036.44 |
| විලම්භිත බදු | **16** | 486,768.00 | 545,765.00 |
| නිපුණතා සංවර්ධන අර්ථසාධක අරමුදල | **17** | 3,014,058.54 | 3,278,406.00 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවීම් | **13** | 1,396,847.75 | 860,251.09 |
| **මුළු සම කොටස් හා වගකීම්** | | **186,365,632.92** | **189,133,019.51** |

2007 අංක 07 දරණ සමාගම් පනතින් නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූල වන අන්දමින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව සහතික කරනු ලැබේ.

............................
ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සූදනම් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වේ. සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන්නේ

.....................
අධ්‍යක්ෂ

.....................
අධ්‍යක්ෂ

කොළඹ
2015 සැප්තැම්බර් 10

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයේ අත්‍යාවශ්‍ය හා වැදගත් අංග වේ.
වරහන් යොද පෙන්නුම් කර ඇත්තේ අඩු කළ අගයන් වේ.

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

"නිපුණතා පියස" 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

## 2016 මාර්තු 31න් අවසන් වූ වර්ෂයේ සම කොටස් වල වෙනස්වීම් ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. ශත | ආදායම් සංචිත රු. ශත | වෙනත් සංචිත රු. ශත | රඳවා ගත් ලාභ රු. ශත | එකතුව රු. ශත |
|---|---|---|---|---|---|
| 2014 අප්‍රේල් 01 වන දිනට ශේෂය | 102,001,520.00 | 479,890.00 | (99,420.33) | 76,156,649.10 | 178,538,639.10 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | - | - | 7,306,843.17 | 7,306,843.17 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | - | - | (197,882.33) | (2,550,038.00) | (2,747,920.33) |
| 2015 මාර්තු 31 වන දිනට ශේෂය | **102,001,520.00** | **479,890.00** | **(297,302.33)** | **80,913,454.27** | **183,097,561.94** |
| **2015 අප්‍රියෙල් 01 වන දිනට ශේෂය** | 102,001,520.00 | 479,890.00 | (297,302.29) | 80,913,454.27 | 183,097,560.98 |
| **වර්ෂයේ ශුද්ධ ලාභය** | | | | (3,220,858.49) | (3,220,858.49) |
| **2016 මාර්තු 31 වන දිනට ශේෂය** | **102,001,520.00** | **479,890.00** | **(297,303.29)** | **77,692,595.78** | **179,876,702.49** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයේ අත්‍යාවශ්‍ය හා වැදගත් අංග වේ.
වරහන් යොදා පෙන්නුම් කර ඇත්තේ අඩු කළ අගයන් වේ.

## සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

**"නිපුණතා පියස" 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.**

**2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2015/2016<br>රු. ශත | 2014/2015<br>රු. ශත |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | |
| ආදායම් බදු වියදමට පෙර ශුද්ධ ලාභය/(අලාභය) | (3,279,855.49) | 9,601,736.20 |
| **ගැලපීම්** | | |
| ඉවත් කිරීමේ ලාභ / (අලාභ) | - | 48,400.00 |
| ක්ෂය කිරීම | 3,627,484.27 | 2,706,912.75 |
| පොළී ආදායම | (7,823,666.31) | (10,063,964.33) |
| මූල්‍ය වියදම් | 64,990.00 | - |
| පාරිතෝෂිත සැපයුම් | 519,869.70 | 300,060.40 |
| ලේඛණ වලින් ඉවත්කරන ලද ලැයිස්තු හා තැන්පතු | - | 121,135.00 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස් කිරීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **(6,891,177.83)** | **2,714,280.02** |
| **ප්‍රාග්ධනයේ වෙනස් වීම්** | | |
| භාණ්ඩ ලේඛණය (වැඩිවීම)/අඩුවීම | (295,844.20) | - |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (2,884,181.12) | (654,562.74) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 536,596.66 | (213,507.90) |
| යෞවන කටයුතු අමාත්‍යාංශයට ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | (264,347.46) | 3,278,406.00 |
| මෙහෙයුම් කටයුතු වලින් මුදල් ඉපදවීම් | **(10,143,593.95)** | **2,547,425.35** |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ස්ථිර තැන්පතු වල ආයෝජනය | 44,987,986.85 | 910,997.33 |
| පොළී ආදයම් ලැබීම් | 7,823,666.31 | 10,063,964.33 |
| දේපළ,පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (394,807.86) | (9,077,169.82) |
| දේපළ,පිරියත හා උපකරණ වල විකුණුම් උත්පාදන | - | 5,400.00 |
| ශිෂ්‍යත්ව අරමුදල් ස්ථිර තැන්පතු ආයෝජන වලින් | (198,214.54) | (3,200,000.00) |
| **ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **52,218,630.76** | **(1,296,808.16)** |
| **මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ලාභාංශ ගෙවීම් | - | (2,550,038.00) |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **-** | **(2,550,038.00)** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **42,075,036.81** | **(1,296,808.16)** |
| **වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 3,770,640.69 | 5,070,061.50 |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **45,845,677.50** | 3,770,640.69 |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| බැංකුවේ මුදල් - ලංකා බැංකුව - 801 | (49,765.95) | 446,524.33 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 764148708 | 161,076.00 | 103,406.00 |
| ඒක්ෂණ තැන්පතු | 45,667,626.20 | 3,153,969.11 |
| අතැති මුදල් | 66,741.25 | 66,741.25 |
| | **45,845,677.50** | **3,770,640.69** |

ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනයෙන් ගත් අනුකූල කොටසකි.
වරහන් තුළ ඇති ඉලක්කම් අඩුකිරීම් ලෙස පෙන්වයි.

## සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

## "නිපුණතා පියස" 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2015/2016

**01. පොදු කරුණු**

**1.1 නෛතික තත්ත්වය**

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල ශ්‍රී ලංකාව තුල සංස්ථාපනය කර නිත්‍ය වශයෙන් පවත්වා ගෙන යන සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 05, ඇල්විටිගල මාවතේ අංක 354/2 , 7 වෙනි මහල"නිපුණතා පියස" හි පිහිටා ඇත.

**1.2 ව්‍යාපාරික ස්වභාවය සහ ප්‍රධාන ක්‍රියාකාරකම්**

වර්ෂය තුල සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ

- රැකියා සඳහා ඇතුල් වීමට පුහුණු වීමට සහාය වීම, නිපුණතා වැඩි දියුණු කිරීම සේවකයින් නැවත පුහුණු කිරීම.
- ඉහළ මට්ටමක පුහුණුවක් සහ නිපුණතා පූර්ණ ශ්‍රම බලකාය සංවර්ධනය සඳහා ව්‍යවසාය පදනම් කොට ගත් පුහුණුව පෘථුල කිරීම සහ වැඩි දියුණු කිරීමට පහසුකම් සැපයීම.
- පුහුණු කිරීමේ ආයතන සහ සේව්‍යයන් අතර සම්බන්ධතාවයන් සැපයීම.

**1.3 නිකුත් කිරීම සඳහා අවසර දී ඇති දිනය**

2016 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සී/ස නිපුණතා සංවර්ධන අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 03 වන දින නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර ලබා දී ඇත.

**1.4 පිළියෙල කිරීමේ පදනම**

**1.4.1 අනුකූලවීමේ ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශන වල අඩංගු වන සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමග ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වලට සටහන් ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරණ ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS / LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

**1.4.2 අඛණ්ඩ භාවය**

අඛණ්ඩව පවත්වා ගෙන යාමට සමාගමේ ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරුවක් නිර්මාණය කර ඇත. ඈවර කරන හෝ කඩාකප්පල් වූ වෙළඳාමක් ලෙස ඔවුහු අදහස් නොකරනු ලැබේ.

**1.4.3 ඉදිරිපත් කිරීමේ පදනම**

එකතුවීමේ පදනම හා ඉතිහාසය පිළිබඳ වූ පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් උද්ධමනීය කරුණු සඳහා කිසිඳු සකස් කිරීමක් සිදුකර නොමැත.

**1.4.4 කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරන වලංගු මුදල්**

සමාගමේ කෘත්‍යාත්මක වලංගු මුදල් මූල්‍ය ප්‍රකාශනයේ ශ්‍රී ලංකාව තුල රුපියල් ඉදිරිපත් කර ඇත. සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල්, ආසන්නම රුපියලට වටිනාකමින් නැතහොත් වෙනත් අයුරකින් ඉදිරිපත් කර ඇත.

### 1.4.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම් සම්මතයන්(SLFRS/LKAS), තීන්දු සෑදීමට කළමණාකරණ නියමයන්, ගිණුම් ප්‍රතිපත්ති භාවිතයේ බලපෑම සහ වත්කම් වල ආදායම් හා වියදම්හි වගකීම වාර්තාගත ප්‍රමාණයන් සමග අනුකූලතාවය තුළ සකස් කරනු ඇත.

විනිශ්චයන් හා ඇස්තමේන්තු, පෙර පළපුරුද්ද, නැඹුරුතාවයන් හා වාතාවරණයන් යටතේ සාධාරණ වීමට විශ්වාස කරන ලද අපේක්ෂාවන් ඇතුලත් වෙනත් කරුණු, පදනම් වී ඇත.

මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත් ප්‍රමාණයන් මත වඩා අර්ථාන්විත බලපෑම් තිබෙන ගිණුම් ප්‍රතිපත්ති පිළිපැදීම තුළ අවදානම් තීන්දු පිළබඳ තොරතුරු පහත සඳහන් සටහන් තුළ ඇතුලත් කර ඇත.

සටහන් 12 - විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ මිණුම්

සටහන් 16 - විලම්භිත බදු

### 1.4.6 සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂ වල සංශෝධන කර තිබෙන අදාල අවස්ථාවේ දී වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සහ වත්මන් වර්ෂය සමග සංසන්දනාත්මක වීමට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම් හා පැහැදිලි කිරීම් කර ඇත.

## 02 අර්ථාන්විත ගිණුම් කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී යොදා ගෙන ඇති ප්‍රධාන ගිණුම් කරණ ප්‍රතිපත්ති පහත විදහා දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති නිත්‍ය වශයෙන්ම සෑම වර්ෂයකම භාවිතාකර ඉදිරිපත් කර ඇති අතර නැතහොත් වෙනත් ආකාරයකට ප්‍රකාශ කර ඇත.

### 02.1 වත්කම් හා ඒවායේ ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන තුළ වර්තමාන වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් ස්වරූපයන්, මුදල්, බැංකු ශේෂ සහ සමාගමේ සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කාල ක්‍රමය ඇතුළත ප්‍රත්‍යක්ෂ කර ගැනීමට අපේක්ෂිත මුදල් හෝ වාර්තාකරණ දිනයේ සිට එක වර්ෂයක් ඇතුළත ඒවායින් අඩු අවස්ථාව, වත්කම්, වර්තමාන වත්කම් වලට වඩා වැඩිපුර ඇති වත්කම්, ඒවා වාර්තා කරන දිනට පෙර වර්ෂයක කාලයක් රඳවා තබා ගැනීමට සමාගම අදහස් කරයි.

### 2.1.1 දේපළ, පරියත හා උපකරණ

#### 2.1.1.1 හඳුනා ගැනීම හා මිණුම

දේපළ, පරියත හා උපකරණ, වටිනාකම අඩු පිරිවැයක දී සහ අඩුවීම එකතු වූ අලාභයන්හිදී ප්‍රකාශ කර ඇත.

අත්කර ගැනීමට දරණ පිරිවැය හා ඒවායේ ක්‍රියාකාරි තත්ත්වයට හෝ භාවිතයට අදහස් කරන තත්ත්වයට වත්කම් ගෙන ඒමට දරණ ලද ඕනෑම සෘජු ආරෝපණීය වියදම් පිරිවැයට මෙම කාරණය සඳහා වන පිරිවැය ඇතුළත්ය. එසේම, පවතින වත්කම් වල කොටස් වෙන් කරන හා ඉවත් කරන පිරිවැයද ඇතුළත්ය.

ප්‍රධාන නොනිම් වැඩ විෂය වූ වත්කම් ගිණුම් වලට, ප්‍රයෝජනයට යොදා ගත් පළමු අවස්ථාවේ හෝ බලයලත් වත්කම් ඇති අවස්ථාවන් වෙත මාරු කර ඇත. කෙසේ වුවද වාර්තා කරන දිනට ප්‍රධාන නොනිම් වැඩ නොපවතී.

වැඩදායකව පවතින දේපළ, පරියත හා උපකරණ වල වෙනසක් ඇති විට, දේපළ, පරියත හා උපකරණ වල වෙන්වූ අයිතම ලෙස ඒ සඳහා ගණනය කරනු ලැබ ඇත.

දේපළ, පරියත හා උපකරණ වල බැහැර කිරීම මත ලාභ හා අලාභ, ඉවත දැමීම් වලින් ලබන මුදල් හා දේපළ, පරියත හා උපකරණ වලින් ගෙන යන ලද ප්‍රමාණයන් හා විස්තීර්ණ ආදායම් වාර්තා තුළ වෙනත් ආදායම් යටතේ හඳුනා ගත් දෑ අතර වෙනස හැටියට තීරණය කරනු ලැබ ඇත.

### 2.1.1.2 අපරාපරිය වියදම්

දැනට පවතින දේපළ, පරියත හා උපකරණ මත දරා තිබෙන වියදම්, නියමාකාර ලෙස තක්සේරු කිරීම් තුළ සහ විශ්වාසනීය ලෙස මැනිය හැකි පිරිවැය, එවැනි වියදම් ප්‍රථිපල ලබා ගත හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර ඇති අවස්ථාවේදී ප්‍රාග්ධනය සපයා ඇත. හිලව් කරන ලද වත්කම්හි ගෙන යන ප්‍රමාණය හඳුනා ගෙන නොමැත.

දේපළ, පරියත හා උපකරණ වල එදිනෙදා සේවාවන්/නඩත්තු සඳහා වන පිරිවැය, දරා ඇති ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇත. වත්කම් නැවත අගයන විටදී ඉපයීම් රඳවා ගන්නට මාරුකර ඇති වෙන් කරන ලද අතිරික්ත පිළිඇගයීම තුළ ඇතුළත් කර ඇති ප්‍රමාණයන් පිළියෙල කොට ඇත.

### 2.1.1.3 හඳුනා නොගැනීම

දේපළ, පරියත හා උපකරණයන්හි අයිතම වල ගෙන යන ප්‍රමාණයන්, බැහැර කිරීම හෝ හඳුනා නොගත් හෝ අනාගත ආර්ථික වාසියක් නොමැති විට ඒවාගේ භාවිතයන් හෝ ඉවත් කිරීම අපේක්ෂා කෙරේ. හඳුනා නොගැනීම මත වන ලාභ හෝ අලාභ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ හඳුන්වා ඇත.

### 2.1.1.4 ණය ලබා ගැනීමේ පිරිවැය

ණය ලබා ගැනීමේ පිරිවැය, ලබා ගැනීමට සෘජුව ආරෝපණය කළ හැකි යෝග්‍ය වත්කම් වල, ඉදිකිරීම් හෝ නිෂ්පාදන භාවිතයට බලාපොරොත්තු වන හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට ප්‍රමාණවත් කාල පරිච්ඡේදයක් ලබා ගැනීම යන දේවල වත්කම්හි කොටසක් ලෙස මුදල් බවට හරවා ගෙන ඇත. ණය ලබා ගැනීමේ පිරිවැයෙහි ප්‍රමාණයන් ප්‍රාග්ධනය සම්පාදනයට යෝග්‍ය දෑ, ණය ලබා ගැනීමේ පිරිවැය (LKAS-23) තුළ සම්මුතීන් සමග තීරණය කරයි.

ණය ලබා ගැනීමේ පිරිවැය, ඒවා දරණ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ආරෝපිත කාල පරිච්ඡේදයක් තුළ වියදම් ලෙස හඳුනාගත් දෑ මුදල් බවට හරවා නොමැත.

### 2.1.1.5 මිල අඩු වීම හා ක්‍රමක්ෂය

මිල අඩුවීම, වත්කම්හි පිරිවැය හෝ පිරිවැය සඳහා වෙනත් ආදේශිත ප්‍රමාණයන්, අඩු ඒවායේ අවශේෂ වටිනාකම්, මිල අඩුවිය හැකි ප්‍රමාණයන්ට වඩා වැඩිපුර ගණනය කර ඇත.

මිල අඩුවීම, වත්කම් වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි, පරිභෝජනයන්ගේ අපේක්ෂිත රටාවන්හි, ඉතා ආසන්නම පරාවර්ථීතයන් වල සිට එක් එක් වත්කම් හි ඵලදායී ප්‍රාණවත් කම සෘජු රේඛා පදනම මත ඇස්තමේන්තු කර ලාභ හෝ අලාභ හඳුනා ගෙන ඇත.

ඇස්තමේන්තු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඵලදායී වත්කම් පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| පරිගණක උපකරණ | වසර | 04 | ට වැඩි |
| වෙනත් කාර්යාල උපකරණ | වසර | 05 | ට වැඩි |
| මෝටර් රථ | වසර | 04 | ට වැඩි |
| නව කාර්යාල පරිශ්‍රය | වසර | 10 | ට වැඩි |
| ගෘහ උපකරණ හා සවිකිරීම් | වසර | 10 | ට වැඩි |

වත්කම් මිල අඩුවීම ආරම්භ වන්නේ භාවිතය සඳහා තිබෙන එහෙත් කලින් නවතන ලද වත්කම් වල, වර්ග කර විකිණීම සඳහා රඳවා ඇති හා හඳුනා නොගත් වත්කම් වල දිනයන්හි සිටයි.

මිල අඩු කිරීමේ ක්‍රමය ඵලදායී ප්‍රාණවත්කම හා අවශේෂ වටිනාකම් කාලානුරූපීව සකසන ලද හා එක් එක් මූල්‍ය වර්ෂ අවසානයට සමාලෝචනය කර ඇත.

### 2.1.1.6 මූල්‍යමය නොවන වත්කම් අඩුකිරීම

එක් එක් වාර්තා කරන දිනයන්හි දී සමාගමේ තක්සේරුව කුමක් නමුත් අඩුවිය හැකි වත්කම් පිළබඳ සංඥවක් ඇත. එවැනි ඕනෑම සංඥවක් තිබුනත් හෝ සමාගම වත්කම් වල අය කර ගත හැකි ප්‍රමාණයන් ඇස්තමේන්තු සැකසීමේ දී වාර්ෂික අඩුකිරීම් අවස්ථාවේ දී වත්කම් පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. නැතහොත් වත්කම් මුදල් ඉපයීම ජනනය නොකරයි. බොහෝදුරට ඒවා වෙනත් වත්කම් වලින් හෝ වත්කම් සමූහ වලින් ස්වාධීන වේ. ඉක්මවා ගිය වත්කම් ගෙන යන ප්‍රමාණය කොතැනද එහි ආපසු ලබා ගතහැකි ප්‍රමාණය, වත්කම් අඩුකිරීම සලකනු ලබන සහ ඒවායේ ආපසු ලබා ගත හැකි ප්‍රමාණ ලේඛණ ගත කරයි.

භාවිතය තුළ තක්සේරු වටිනාකම ඇස්තමේන්තුගත හා අනාගත මුදල් ප්‍රවාහය, මුදලේ කාලීන අගය හා වත්කම් හි විශේෂ අවධානම පිළිබඳ වත්මන් වෙළඳ පොළ තක්සේරු, පෙර බදු වට්ටම් අනුපාත භාවිතා කරමින් ඒවායේ අගයට වට්ටම් ලබා දී ඇත. විකිණීම සඳහා, සාධාරණ අගය හා අඩු පිරිවැය නිශ්චය කිරීම තුළ නූතන වෙළඳ පොළ ගණුදෙනු තිබුණ හොත් ගිණුම් තුළට ගෙන ඇත. එවැනි ගණුදෙනු නොතිබුන හොත් හඳුනා ගැනීමට පුළුවන් කාලානුරූප තක්සේරු කිරීමේ නිරූපක භාවිත කර ඇත.

අඩු කිරීම් නැතිව පවත්වා ගෙන යන මෙහෙයුම්, වත්කම් අඩුකිරීමේ කාර්යයන් සමග වෙනස් නොවන වියදම් වර්ග විස්තීර්ණ ආදායම් ප්‍රකාශන තුළ හඳුනා ගෙන ඇත. කලින් හඳුනාගත් අවලංගු කිරීමකින් පමණක් අඩු කිරීම් නැතිවීම, භාවිතා කරන ලද ඇස්තමේන්තුවේ වෙනස් වීමක් සිදු වුවහොත් වත්කම් ආපසු ලබා ගැනීමේ ප්‍රමාණය, අවසානයට හඳුනාගත් අඩුවීම් ක්ෂයවීමේ සිට තීරණය කර ඇත.

අවස්ථාව මෙය වුවහොත් වත්කම්වල ගෙන යන ප්‍රමාණය ආපසු ලබා ගැනීමේ ප්‍රමාණය දක්වා වැඩි කරනු ලැබ ඇත. තීරණය කරන ලද ගෙන යන ප්‍රමාණය එම වැඩි කරන ලද ප්‍රමාණය ඉක්මවා යා නොහැක. ශුද්ධ මිල අඩුවීම පූර්ව වසර වල අඩුකිරීම් නැති බවට හඳුනාගත් වත්කම් නොවිය යුතුය. විස්තීර්ණ ආදායම් ප්‍රකාශන තුළ එවැනි වෙනස් කම් හඳුන්වා දී ඇත. මුදල් හා කෙටිකාලීන තැන්පතු වෙළඳ හා අනිකුත් ලැබීම් ගණනය සහ ආපසු ලැබීම් සමාගමේ මූල්‍ය වත්කම් වලට ඇතුළත්ය.

### 2.1.2 මූල්‍ය මෙවලම්

### 2.1.2.1 මූල්‍ය වත්කම්

### 2.1.2.1.1 මූලික හඳුනා ගැනීම් සහ මිණුම්

මූල්‍ය වත්කම් LKAS-39 විෂය පථය ඇතුළත, ලාභ හෝ අලාභ අතර පැහැදිළි අගයන්හිදී ණය හා ආපසු ලබා ගැනීම්, ආයෝජන කල් පිරීම් මත රඳවා ඇති හෝ කාලානුරූපී ලෙස විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම්, මූල්‍ය වත්කම් ලෙස වර්ග කර ඇත. මූල්‍ය වත්කම් හි මූලික හඳුනා ගැනීම් වලදී ඒවායේ වර්ගීකරණ සමාගම විසින් තීරණය කරනු ලබයි. සියළුම මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ අතර සාධාරණ අගයක් නොවූ අවස්ථාවේ දී, ඉදුරාම ආරෝපණය කළ හැකි ගණුදෙනු පිරිවැය සාධාරණ අගයන්ට එකතු කිරීමට මූලික වශයෙන් හඳුනා ගෙන තිබේ.

### 2.1.2.1.2 අපරාපරිය මිණුම්

මූල්‍ය වත්කම් වල අපරාපරිය ගිණුම්, ඒවායේ පහත සඳහන් වර්ගීකරණ මත රඳා පවතී.

**ලාභ හෝ අලාභ අතරින් සාධරණ අගයන්හි මූල්‍ය වත්කම්**

ලාභ හෝ අලාභ අතරින් සාධරණ අගයන්හි වෙළඳපොළ රඳවා ඇති සහ මූලික හඳුන්වා දීම මත නම් කර ඇති මූල්‍ය වත්කම් ඇතුළත් කර ඇත. මූල්‍ය වත්කම් ඒවා විකිණීමේ අරමුණ මත ලබා ගත් හෝ ආසන්නම අවස්ථාව තුළ නැවත මිළදී ගැනීම් මත වෙළඳාම සඳහා රඳවා ඇති ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ව්‍යුත්පන්න, වෙන් වශයෙන් ඇතුළත් කළ ව්‍යුත්පන්න ද ඇතුළත්ව වෙළඳාම සඳහා රඳවා ඇති ලෙස හෝ නැතහොත් ඵලදායි ඉදිරි සුරැකුම් භාණ්ඩ ලෙස නියම කර ඇති ලෙස ද වර්ගීකරණය ද කර ඇත. විස්තීර්ණ ආදායම් ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය වත්කම්, හඳුනා ගන්නා ලද සාධාරණ අගයන් තුළ ඇති මූල්‍ය ආදායම් හෝ මූල්‍ය පිරිවැය තුළ මූල්‍ය ප්‍රකාශනයේ ස්ථාන වලට ගෙන ගොස් ඇත.

2016 මාර්තු 31 දින වසර අවසානයට ලාභ හෝ අලාභ අතරින් සාධාරණ අගයන්හි මූල්‍ය වත්කම් ලෙස නම් කරණ ලද කිසිදු වත්කමක් සමාගම විසින් රඳවා ගෙන නොමැත.

**ණය හා අය කර ගැනීම්**

ණය හා අය කර ගැනීම්, ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් සමග ස්ථාවර හෝ නිශ්චය කරන ලද ගෙවීම්, ක්‍රියාකාරී වෙළඳපොළ තුළ මිල ගණන් නියම කර නොමැත. මූලික මිණුමකින් පසුව එවැනි මූල්‍ය වත්කම් ඵලදායී පොළී අනුපාත ක්‍රමය (EIR) ක්‍රමක්ෂය පිරිවැය භාවිතා කරමින් කුඩා අඩුවීම් දෙවනුව මනිනු ලැබ ඇත. ක්‍රමක්ෂය කරන ලද පිරිවැයක් ඕනෑම වට්ටමක හෝ ලාභ මත වාරිකය සහ ගාස්තුවක් හෝ ඵලදායී පොළී අනුපාතයන්හි අවශ්‍ය කොටසක් ගිණුම් තුළට ගනිමින් ගණනය කර ඇත.

ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමක්ෂය කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් මූල්‍ය වත්කම් තුළ ඇතුලත් කර ඇත. අඩුවීම් වලින් පාඩු සිදුවීමේ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් මූල්‍ය පිරිවැය හඳුන්වා දී ඇත. සමාගම විසින් ණය සහ වාණිජ අය කර ගැනීම්, තැන්පතු අත්තිකාරම් සහ වෙනත් අයකර ගැනීම් හා මුදල් සහ මුදල් වලට සමාන දෑ අඩංගු වේ.

**කල් පිරෙන ආයෝජන රඳවා ගැනීම**

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සමග ස්ථිර හෝ නිශ්චිත කරන ලද ගෙවීම් සහා ස්ථිර කල්පිරීම් ඒවායේ කල් පිරීම දක්වා රඳවා ගැනීමට හැකියාවක් සහා ධනාත්මක අරමුණක් සමාගමට ඇති විට කල් පිරීම දක්වා රඳවා ගැනීම ලෙස වර්ග කර ඇත.

මූලික මිනුමකින් පසුව කල්පිරීම දක්වා රඳවා ගනු ලබන ආයෝජන, ඵලදායී පොළී අනුපාත ක්‍රම, කුඩා අඩුවීම් භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය අවස්ථාවේ දී මනිනු ලැබ ඇත. ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ඕනෑම වට්ටමක් හෝ ලාභ මත ඇති වාරිකයක, සහ ගාස්තු හෝ ඵලදායී පොළී අනුපාතයන් (EIR) හි අවශ්‍ය කොටසක් ලෙස අති පිරිවැය, ගිණුම් තුළට ගනිමින් ගණනය කර ඇත.

**විකිණීම සඳහා තිබෙන මූල්‍ය ආයෝජනයන්**

විකිණීම සඳහා තිබෙන මූල්‍ය ආයෝජන වලට සම කොටස් හා ණය සුරැකුම් පත් ඇතුළත් වේ. කොටස් ආයෝජනය, වෙළඳාම් කිරීම සඳහා රඳවා නොමැති, ලාභ හෝ අලාභ අතරින් පැහැදිලි අගයක් නම් කර නොමැති අවස්ථා වලින් එකක හෝ නොවන දේ විකිණීමට තිබෙන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. මෙම වර්ගයේ ණය සුරැකුම් පත් විකිණේවි යයි යන ප්‍රතිචාරය තුළ ද්‍රවශීලිතාවය සඳහා අවශ්‍යතා හෝ වෙළඳ පොළ තත්වයන් අනුව වෙනස් කෙරේ යන ප්‍රතිචාරය තුළ සීමාවක් නොමැති කාල පරිච්ඡේදයක් සඳහා රඳවා ඇති ලෙස අදහස් කරනු ලැබ ඇත.

මූලික මැනීමකින් පසුව විකිණීම සඳහා තිබෙන මූල්‍ය ආයෝජන සඳහා හඳුනා ගන්නා තෙක්, විකිණීම සඳහා තිබෙන දේ තුළ වෙනත් විස්තීර්ණ ආදායම් හැටියට සාක්ෂාත් කර නොගත් ලාභ හො අලාභ හෝ හඳුනාගත් පාඩු සමග පැහැදිළි අගයන් දෙවන වර මනිනු ලබයි. වෙනත් ක්‍රියාත්මක ආදායම් තුළ එකතුවන ලාභ හා අලාභ හෝ අඩුකිරීමේ අගය තීන්දු කිරීම හඳුනා ගන්නා අවස්ථාවේ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට මූල්‍ය පිරිවැය සහ විකිණීම සඳහා වෙන්කර ඇති දේ වලින් ඉවත් කරන ලද දේ තුළ එකතුවන අලාභ නැවත වර්ගීකරණය කරන අවස්ථාවේදී විකිණීමට තිබෙන ණය සුරැකුම් පත් මත පොළී ආදායම, ඵලදායී පොළී අනුපාත ක්‍රම සහ හඳුනා ගන්නා ලද ලාභ හෝ අලාභ භාවිතා කරමින් ගණනය කර ඇත.

**2.1.2.1.3 හඳුනා නොගැනීම**

මූල්‍ය වත්කමක (මූල්‍ය වත්කමක කොටසක් ලෙස හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක් ලෙස) හඳුනා නොගත් අවස්ථාවක දී,

- කල් ඉකුත් වූ වත්කම් වලින් මුදල් ප්‍රවාහය ලැබීමට හිමිකම
- "ඔබ්බට යාම" පිළිවෙල යටතේ තුන්වන පාර්ශවයක ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් කිසිදු ප්‍රමාදයකින් තොරව වත්කම් වෙතින් ගෙවීමට බැඳී සිටින ලෙස පිළිගෙන ඇති සහ

(අ) වත්කම් වල සැළකිය යුතු සියලුම අවධානම් සහ වත්කම් වල පරිදානයන් සමාගම විසින් පවරා ඇත යන දෙකෙන් එකක් හෝ

(ආ) සමාගම විසින් ඒවායේ හිමිකම් පවරා නැති හෝ සැළකිය යුතු අන්දමින් රඳවා නොගන්නා යන දෙකෙන් එකක්වත් නොවන නමුත් වත්කම් හි පාලනය පවරා ඇති මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාගම විසින් හිමිකම් පවරා ඇත.

### 2.1.2.1.4 මූල්‍ය වත්කම් අඩුකිරීම

සමාගම, එක් එක් වාර්තාකරණ දිනයන්හි දී ඕනෑම විෂයානුබද්ධ සාක්ෂියක් හෝ මූල්‍ය වත්කම් සමූහයක අඩුවීමක් යන දෙකෙන් එකක් තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක අඩුවීමක් ලෙස සැළකුව හොත්, පමණක්ම වුවහොත්, අඩුවීමක විෂයානුබද්ධ සාක්ෂියක් වේනම්, සිදුවීම් එකක හෝ වැඩි ප්‍රමාණයක ප්‍රතිඵලය හැටියට, වත්කම් වල මූලික හඳුනා ගැනීමකින් පසුව දක්නට ඇත. "අවාසි සහගත සිදු වීම" යටතේ සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත, මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයන්හි විශ්වාසනීය ඇස්තමේන්තු වල ගැටුම් පවතී.

සමාගම 2014 මාර්තු 31, සහ 2015 මාර්තු 31 සහා 2016 මාර්තු 31 දිනයන් ගෙන් අවසාන වර්ෂයන් සඳහා සළකනු ලබන මූල්‍ය වත්කම් තුළ කිසිදු අඩුවීමක්, පාඩුවක් හඳුනා ගෙන නැත.

### 2.1.2.2 මූල්‍ය වගකීම්

### 2.1.2.2.1 මූලික හඳුනා ගැනීම් හා මිනුම්

මූල්‍ය වගකීම් LKAS-39 හි අවකාශය ඇතුළත ලාභ හෝ අලාභ අතරින් සාධාරණ අගය හෝ කාලානුරූප ලෙස ණය හා ණයට ගැනීම් මූල්‍ය වගකීම් ලෙස වර්ග කර ඇත. සමාගම මූලික හඳුනා ගැනීමේ දී ඒවායේ මූල්‍ය වගකීම් හි වර්ගීකරණය නිශ්චය කරයි. අත්පත් කර ගැනීමට හෝ එවැනි වගකීම් නිකුත් කිරීමේ දී සෘජුවම ආරෝපණය කළහැකි ණය සහ ණයට ගැනීම් ගණුදෙනු පිරිවැය අවස්ථාවේදී සාධාරණ අගයට එකතු වීමේදී සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් හඳුනා ගෙන තිබේ. සමාගමේ මූල්‍ය වගකීම් වලට ඇතුළත් වෙළඳ හා වෙනත් ගෙවීම්, බැංකු අයිරා, ණය හා ණය ණයට ගැනීම්, අපරාපරිය මිණුම්, ලාභ හා අලාභ අතරින් සාධාරණ අගයේ දී වෙළඳ හා මූල්‍ය වගකීම් නියම කරන ලද මූලික හඳුනා ගැනීමක උපයන ලාභ හෝ අලාභ අතරින් සාධාරණ අගය ලෙස රඳවා තිබෙන මූල්‍ය වගකීම් අතුළත්ව ලාභ හා අලාභ අතරින් සාධාරණ අගයේ දී මූල්‍ය වගකීම් සලකනු ලබයි. මූල්‍ය වගකීම් ලබා ගතහොත් නුදුරු අවස්ථාවකදී විකිණීමේ අරමුණ සඳහා අවශ්‍ය වෙළඳාම් සඳහා රඳවා තබා ඇති ලෙස වර්ගීකරණය කරනු ලබයි. විකිණීම සඳහා වගකීම් රඳවා ගැනීම මත ලාභ හෝ අලාභ විස්තීණ ආදායම් ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබේ.

සමාගම ලාභ හෝ අලාභ අතුරින් සාධාරණ අගය හැටියට මූලික හඳුනා ගැනීමක් මත කිසිදු මූල්‍ය වගකීමක් නියම කර නැත. මූලික හඳුනා ගැනීමකින් පසුව ණය හා ණය ගැනීම්, පොළී දැරීම්, ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයකදී ණය හා ණය ගැනීම් දෙවනුව මණිනු ලබයි. වගකීම් හඳුනා ගන්නා විට එලෙසම ඵලදායී පොළී අනුපාත ක්‍රමය අතුරින් ක්‍රමක්ෂය ක්‍රියාවලිය හැටියට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ලාභ හා අලාභ හඳුනා ගනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැය ඕනෑම වට්ටමක් හෝ අත්කර ගැනීම් සහ ගාස්තු හෝ EIR. අඛණ්ඩ කොටසක් පිරිවැය වාරිකගිණුම් තුලට ගනිමින් ගණනය කරනු ලබයි. EIR ක්‍රමක්ෂය පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි මූල්‍ය පිරිවැය තුළ ඇතුළත් වේ.

### 2.1.2.2.2 හඳුනා නොගැනීම

වගකීම් යටතේ බැඳීම් නිදහස් වීම හෝ කල් පිරීම මත අවලංගු වීමකදී මූල්‍ය වගකීමක් හඳුනා නොගනී.

### 2.1.2.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

දැනට බලාත්මක කළහැකි නීති හිමිකම් හිලව් කිරීමට හඳුනා ගන්නා ප්‍රමාණයන් සහ ශුද්ධ පදනම මත පියවීමට අදහසක් ඇති, හෝ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගැනීමට හැකි වත්කම් සහ වගකීම් එකවර පියවන්නෙ නම්, එපමණක්ම නම් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරනු ලබයි.

### 2.1.2.4 මූල්‍ය අවධානම කළමණාකරණය

**ණය අවධානම**

ණය අවධානම යනු පාරිභෝගිකයා හෝ විරුද්ධ පාර්ශවය, මූල්‍ය උපකරණ අසමත් වීමකට ඒවායේ ගිවිසුම පිළිබඳ බැඳීම් හමුවීමට හා පාරිභෝගිකයන්ගේ හා සම්බන්ධ පාර්ශවයන්ගෙන්, සමාගමේ අයවිය යුතු දේවලින් ප්‍රධාන පැන නැගීම් පැවතුනහොත් සමාගමට වන මූල්‍ය හානිවල අවධානමයි. සමාගම, වෙළඳ හා වෙනත් අයවිය යුතු දේවල් සහ ආයෝජන විෂයයන් තුළ දරණ ලද අඩුවීම සඳහා ඉදිරිපත් කරන ඒවායේ තක්සේරු වෙනුවෙන් දීමනාවක් තහවුරු කරයි.

**ද්‍රවශීලතා අවධානම**

ද්‍රවශීලතා අවධානම යනු, මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් බාරදෙමින් පියවන ලද මූල්‍ය වගකීම් සමග සම්බන්ධ වී ඇති හමුවන බැඳීම් තුළ සමාගම මුහුණ දීමට ඇති දුෂ්කරතා වල අවධානමයි. යටත්වීමක් නොමැතිව නොපිළිගත හැකි අලාභයක් හෝ සමාගමේ කීර්ති නාමයට හානියක් වියහැකි අවධානමක, සාමාන්‍ය හා ආතතිය තත්ත්වයන් දෙකම යටතේ ගෙවිය යුතු වූවිට, ඒවායේ වගකීම් හමුවට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක සෑම විටම තිබෙනා විට සමාගමේ පිවිසුම ද්‍රවශීලතාවය පාලනය හැකිතාක් දුරට සහතික කිරීමයි.

**පොළී අනුපාත අවධානම**

